රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 29/2018

මගේ අංකය EST-6/04/LON/0207
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.12.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2019 වසර</u>**

2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ 2015 වර්ෂය යන්න වෙනුවට 2018 වර්ෂය යන්න ආදේශ කිරීමට සහ 2016 වර්ෂය ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම 2019 වර්ෂය යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2019 වර්ෂයට රු.4,000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2019.01.01 දිනෙන් ආරම්භ කර 2019.02.28 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2019.02.28 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතුය. මෙම අත්තිකාරම් මුදල 2019 වර්ෂය තුළදීම අයකර අවසන් කළයුතුය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය